# මෙනින්ගෝකෝකල් ACWY ද්විතීයික පාසල් එන්නත් වැඩසටහන් කැමති ප්‍රකාශ කාඩ්පත

සම්පූර්ණ කර අත්සන් කර පාසලට ආපසු එවන්න

### පෝරමය සම්පූර්ණ කරන ආකාරය

- මෙනින්ගෝකෝකල් ACWY තොරතුරු සහ එන්නත් කැමති ප්‍රකාශ තොරතුරු කියවන්න.
- එන්නත් කැමති ප්‍රකාශ කොටස සම්පූර්ණ කර එකහයි නම් අත්සන් කරන්න හෝ ඔබේ නම ටයිප් කරන්න.
- ඔබ ඔබේ දරුවා එන්නත් ලැබීමට කැමති නොවූවත් කැමති ප්‍රකාශ පෝරමය පාසලට ආපසු එවන්න.

## මෙනින්ගෝකෝකල් ACWY තොරතුරු

### මෙනින්ගෝකෝකල් ACWY

මෙනින්ගෝකෝකල් රෝගය බැක්ටීරියාවලින් ඇති වෙයි. මෙනින්ගෝකෝකල් රෝගය දුලර්භ වූවද, එය ඉතා ඉක්මනින් ඉතා බරපතළ විය හැක. සියයට 10 ක් පමණ මිනිස්සු ඔවුන්ගේ උගුර තුළ මෙනින්ගෝකෝකල් බැක්ටීරියා තිබුණත් අසනීප නොවෙති. එම පුද්ගලයින් 'වාහකයෝ' ලෙස හඳුන්වනු ලැබේ. මෙනින්ගෝකෝකල් බැක්ටීරියා පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට පැතිරෙන්නේ නිතර, සමීප, දීඝර්, ගෙදරදොර සහ ලිංගික සම්බන්ධතාව මගිනි. නව යෞවනයන් මෙනින්ගෝකෝකල් රෝගයට ලක් වීමට වැඩි අවදානම ඇති අතර අන් අයට රෝගය පැතිරවීමට වැඩි ඉඩකඩ තිබේ.

ඉක්මනින් ව්‍යාප්ත වන මෙනින්ගෝකෝකල් රෝගය හට ගන්නේ මෙම බැක්ටීරියා රුධිර ධාරාවට ඇතුළු වී ප්‍රතිරක්තතාවට ('බැක්ටරීමියා' යනුවෙන් ද හැඳින්වෙන රුධිර ආසාදනයට) හෝ ආවෘතිදාහයට (මොළය ආවරණ කරන පටලයේ ප්‍රදාහයට) හේතු විය හැක. සිදුවීම්වලින් සියයට 10 ක් දක්වා මරණය ඇති විය හැක. ඇතැම් විට සන්දිවල, උගුරේ, පෙනහලුවල හෝ බඩවැල්වල ද දැඩි ආසාදනය ඇති විය හැක.

මෙනින්ගෝකෝකල් A, B, C, W, සහ Y ඇතුළුව ඉංග්‍රීසි අක්ෂරමාලාවේ අකුරුවලින් හඳුන්වනු ලබන මෙනින්ගෝකෝකල් බැක්ටීරියාවල විවිධ වගර් (මස්තු කණ්ඩායම්) ඇත. මෑත වසරවලදී, මෙම මෙනින්ගෝකෝකල් වගර්වලින් සමහරක් ඕස්ට්‍රේලියාව පුරා පැතිරී ඇත.

මෙනින්ගෝකෝකල් B එන්නත්කරණය වයස අවුරුදු 15 සිට 19 දක්වා ඇති නව යෞවනයන්ට දැඩිව නිදෙර්ශ කෙරේ. මෙනින්ගෝකෝකල් B එන්නත්කරණය ප්‍රලේඛනය මත ලැබෙන අතර මෙය ගැන ඔබේ වෛද්‍යවරයා සමග සාකච්ඡා කළ හැක.

### මෙනින්ගෝකෝකල් ACWY එන්නත

Nimenrix® නම් මෙනින්ගෝකෝකල් ACWY එන්නත මෙනින්ගෝකෝකල් A, C, W, Y වගර්වලට එරෙහි ආරක්ෂාව සඳහා වන හතර එකකින් ඇති සංයුක්ත එන්නතකි. මෙම එන්නත නව යෞවනයන් තුළ සියයට 97 ක ප්‍රතිශක්තිය දිය හැකි බව අධ්‍යයනවලින් පෙන්නුම් කෙරේ. මෙනින්ගෝකෝකල් ACWY එන්නත්කරණ වැඩසටහන් 2015 සිට එක්සත් රාජධානිය තුළ නව යෞවනයන්ට ක්‍රියාත්මක කෙරෙන අතර 2005 සිට එක්සත් ජනපදය තුළ නිදෙර්ශ වී ඇත.

එන්නත තුළ කිසියම් ජීවමාන බැක්ටීරියා අඩංගු නොවන අතර එය මෙනින්ගෝකෝකල් රෝගය ඇති කළ නොහැක. මෙනින්ගෝකෝකල් ACWY එන්නත නව යෞවනයන් තම ළදරු අවධියේ ලබා ගත් C එන්නත දියුණු කරන අතර A, W, සහ Y වගර්වලට එරෙහිව ආරක්ෂා කරයි.

### එන්නත දෙනු ලබන්නේ කෙසේද?

මෙනින්ගෝකෝකල් ACWY එන්නත්කරණය උඩ බාහුව තුළට විදිනු ලබන තනි නික්ෂේපණයකි.

### මෙනින්ගෝකෝකල් ACWY එන්නතින් ඇති විය හැකි අතුරු ප්‍රතිඵල

බොහෝ අතුරු ප්‍රතිඵල සුළු ඒවා වන අතර ඉක්මනින් වියැකී යයි. පහත සඳහන් ප්‍රතික්‍රියා ඇති වන්නේ නම්, ඒවා එන්නත් කළ විගසින් වෙයි.

### සුලභ අතුරු ප්රතිඵල

- මඳ උණ
- හිසරදය
- කරකැවිල්ල
- බඩගින්න නැති වීම
- එන්නත් කළ ස්ථානයේ වේදනාව, රතු පැහැ ගැනීම සහ ඉදිමුම
- ඕනෑම එන්නතකට පසු විනාඩි 30 ක් දක්වා ක්ලාන්තය ඇති විය හැක.

මෘදු ප්රතික්රියා ඇති වන්නේ නම්, එම අතුරු ප්රතිඵල මෙසේ අඩු කර ගත හැක:

- වැඩිපුර දියර පානය කිරීම සහ පුද්ගලයාට උණ තිබේ නම් ඕනෑවට වඩා ඇඳුම් නොඇඳීම
- පැරසෙටමෝල් ගැනීම සහ එන්නත් කළ ස්ථානය මත සීතල, තෙත් රෙදි කැල්ලක් තැබීම.

### අතිශයින් දුලර්භ අතුරු ප්රතිඵල

- දැඩි අසාත්මක ප්රතික්රියාව.

දැඩි අසාත්මික ප්රතික්රියාවක් සිදු වන්නේ නම්, වහා වෛද්ය අවධානය දෙනු ලැබේ. ප්රතික්රියා දැඩි හෝ දිගටම පවතින්නේ නම්, හෝ ඔබ කනගාටු වන්නේ නම්, ඔබේ වෛද්යවරයා හෝ රෝහල සම්බන්ධ කර ගන්න.

## පූවර් ප්‍රතිශක්තිකරණ පිරික්සුම් ලැයිස්තුව

ඔබට හෝ ඔබේ දරුවාට ප්රශක්තිකරණයට පෙර, පහත සඳහන් ඒවායින් කිසිවක් අදාළ නම් ඔබේ වෛද්යවරයාට හෝ හෙදියට කියන්න.

- ප්රතිශක්තිකරණ දිනයේ අසනීප වීම (38.5°C ට අධික උෂ්ණත්වය)
- කිසියම් දැඩි අසාත්මිකතාවක් තිබීම
- කිසියම් එන්නතකට දැඩි ප්රතික්රියාවක් තිබීම
- ගැබිණි වී සිටීම

එන්නත් කළ පසු අවම වශයෙන් විනාඩි 15 කට එන්නත් කළ ස්ථානයේ රැඳී සිටින්න.

# අතිරේක තොරතුරු

ඔබට අතිරේක උපදෙස් හෝ තොරතුරු අවශ්ය නම්, ඔබේ පළාත් පාලන සභාවේ ප්රතිශක්තිකරණ සේවය හෝ ප්රදේශයේ වෛද්යවරයා සම්බන්ධ කර ගන්න.

බෙටර් හෙල්ත් නාලිකාව <https//www.betterhealth.vic.gov.au>

ඕස්ට්රේලියානු රජයේ සෞඛ්ය දෙපාතර්මේන්තුව <https:www.health.gov.au/health-topics/immunisation>

භාෂා පරිවතර්න සහ භාෂණ පරිවතර්න සේවා ඇමතුම 131 450

# මෙනින්ගෝකෝකල් ACWY එන්නත් කැමති ප්‍රකාශ පෝරමය

## ශිෂ්‍ය විස්තර (Medicare කාඩ්පතේ සටහන් කර ඇති පරිදි)

| | |
|---|---|
| **Medicare අංකය (ළමයාගේ නම ළඟ ඇති අංකය ඇතුළුව)**<br>**(Medicare නොවන කාඩ්පත් හිමියෝ ද මෙම එන්නතට සුදුසුකම් ලබති)** | |
| **වාසගම** | |
| **මුල් නම** | |
| **තැපැල් ලිපිනය** | |
| **තැපැල් කේතය** | |
| **උපන් දිනය** | |
| **ලිංගිකත්වය** | <ලිංගිකත්වය සඳහන් කරන්න> |
| **පාසැලේ නම** | |
| **වශර්ය** | |

මෙම පුද්ගලයා ඇබොරිජිනල් හෝ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් ප්‍රභවය ඇති කෙනෙක්ද? තෝරා ගත් ප්‍රතිචාරයට ‘X’ එකක් ලකුණු කරන්න

| | |
|---|---|
| **නැත** | |
| **ඇබොරිජිනල්** | |
| **ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වාසි** | |
| **ඇබොරිජිනල් සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වාසි** | |

## මාපිය/භාරකරු සම්බන්ධතා විස්තර

| | |
|---|---|
| **මාපියන්ගේ/භාරකරුගේ නම** | |
| **දිවා කාලයේ දුරකථනය** | |
| **ජංගම දුරකථනය** | |
| **ඉ-තැපැල** | |

## එන්නත් කැමති ප්‍රකාශය

ප්‍රකාශය: එන්නත් කිරීම සඳහා මගේ දරුවා වෙනුවෙන් කැමති ප්‍රකාශය හෝ අකමැති ප්‍රකාශය දීමට මට බලය ඇත. මම එන්නත් නොකිරීමේ අවදානම් සහ එන්නතේ අතුරු ප්‍රතිඵල ඇතළුව එන්නත්කරණය ගැන මා වෙත දුන් තොරතුරු කියවා තේරුම් ගත්තෙමි. මට මගේ ප්‍රදේශයේ සභාව හෝ වෛද්‍යවරයා සමග එන්නත්කරණයේ අවදානම් සහ ප්‍රතිලාභ ගැන සාකච්ඡා කළ හැකි බව මම තේරුම් ගත්තෙමි. එන්නත්කරණය සිදු වීමට පෙර ඕනෑම වේලාවකදී කැමති ප්‍රකාශය ඉවත් කර ගත හැකි බව මම තේරුම් ගත්තෙමි.

පහතින් ඔබේ තෝරාගත් ප්‍රතිචාරය ‘X’ එකකින් ලකුණු කරන්න.

| | |
|---|---|
| **ඔව්, මම පාසලේදී මගේ දරුවා මෙනින්ගෝකෝකල් ACWY එන්නත ලබා ගැනීමට කැමැත්ත දෙමි.**<br>මෙනින්ගෝකෝකල් ACWY එන්නත යනු මෙනින්ගෝකෝකල් A, C, W, Y යන වශර්වලට එරෙහි ආරක්ෂාව සඳහා එකක් තුළ හතරක් සංයුක්ත එකකි (එක එන්නතක්). | |
| ඔබ ඉහතින් ‘ඔව්’ ලෙස තෝරා ඇති නම්, අත්සන් කරන්න හෝ ඔබේ නම ටයිප් කරන්න. | |
| ඔබ මෙම පෝරමයට අත්සන් කළ දිනය දමන්න. | |
| **නැත, මම මේ අවස්ථාවේදී මගේ දරුවා මෙනින්ගෝකෝකල් ACWY එන්නත ලැබීමට කැමැත්ත නොදෙමි.** | |
| **නැත, මගේ දරුවා වෙනත් තැනක මෙනින්ගෝකෝකල් ACWY එන්නත ලබා ඇත.** | |

පෙර පවතින කිසියම් වෛද්‍ය තත්ත්වය, දැඩි අසාත්මිකතා හෝ පෙර එන්නතට ඇති වූ දැඩි ප්‍රතික්‍රියාව මෙහි ඇතුළත් කරන්න.

## පෞද්ගලිකත්ව ප්‍රකාශය

මෙනින්ගෝකෝකල් ACWY එන්නත් වැඩසටහන පොදුරාජ්‍ය මණ්ඩල රජයෙන් අරමුදල් දෙනු ලබන එන්නත් වැඩසටහනකි. එන්නත් විදිනු ලබන්නේ වසරකට කිහිප වරක් වික්ටෝරියාවේ සෑම ද්විතීයික පාසලටම පැමිණෙන, පළාත් පාලන සභාවේ ප්‍රතිශක්තිකරණ සේවාවලින් සේවයට යොදා ගනු ලැබූ ප්‍රතිශක්තිකරණ හෙදියක් විසිනි. *2008 වසරේ මහජන සෞඛ්‍ය සුබසාධන පනත (Public Health and Wellbeing Act 2008)* යටතේ, තම නාගරික දිස්ත්‍රික්කය තුළ ඉගෙනීම ලබන ළමයින් සඳහා වන ප්‍රතිශක්තිකරණ සේවා සම්බන්ධීකරණ කිරීමේ සහ ලබා දීමේ වගකීම පළාත් පාලන සභාවලට ඇත. *2014 වසරේ පෞද්ගලිකත්ව සහ දත්ත ආරක්ෂණ පනතට (Privacy and Data Protection Act 2014)* සහ *2001 වසරේ සෞඛ්‍ය සටහන් පනතට (Health Records Act 2001)* අනුකූලව පුද්ගලික තොරතුරුවල පෞද්ගලිකත්වය, රහස්‍යතාව සහ සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමට පළාත් පාලන සභා කැප වී සිටියි.

පළාත් පාලන සභා පාසල් වැඩසටහන් හරහා ලබා දුන් සියලුම නව යෞවන එන්නත් ගැන ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛනයට (AIR) වාතර්ා කරයි. පුද්ගලිකව හඳුනාගත හැකි විස්තර රහසිගතව තබනු ලැබේ. මෙය නව යෞවන එන්නත්කරණ අනුපාත වැඩිදියුණු කිරීම සඳහා වන ආපසු කැඳවීමේ සහ සිහි කැඳවීමේ පද්ධති වැනි මෙවලම් සපයයි. මෙය සමස්තය වශයෙන් ප්‍රතිශක්තිකරණය වැඩිදියුණු කිරීමට වැදගත් වෙයි. පුද්ගලයින්ට ඕස්ට්‍රේලියානු ප්‍රතිශක්තිකරණ ලේඛනය තුළ සටහන් කර ඇති සියලුම එන්නත් පිළිබඳ ඔවුන්ගේ සටහනට ප්‍රවේශය තිබේ. නිරීක්ෂණය, අරමුදල් දීම සහ මෙනින්ගෝකෝකල් ACWY ද්විතීයික පාසල් එන්නත් වැඩසටහන වැඩිදියුණු කිරීම යන අරමුණු සඳහා වික්ටෝරියානු රජය වෙත සමස්ත ප්‍රතිශක්තිකරණ දත්ත හෙළි කරනු ලැබිය හැක. මෙම තොරතුරු කිසිම පුද්ගලයෙක් හඳුනා නොගනියි.

ඔබ හෝ ඔබේ දරුවා පිළිබඳ තොරතුරු ඔබේ දරුවාගේ ප්‍රතිශක්තිකරණයට සෘජුව අදාළ වන අරමුණු සඳහා සහ ඔබ සාධාරණව අපේක්ෂා කරන මාගර්වලින් භාවිත කිරීම හෝ හෙළි කිරීම සිදු වෙයි. අදාළ තොරතුරු ඔබේ GP හට, ඔබේ දරුවාගේ GP හට, හෝ වෙනත් ප්‍රතිකාර කරන සෞඛ්‍ය සේවයකට හෝ රෝහලකට හෝ වෙනත් පළාත් පාලන සභාවකට මාරු කිරීම හෝ ඒ සමග හුවමාරු කිරීම මෙයට ඇතුළු විය හැක. ප්‍රදේශයේ පාලන සභාව ඔබට කෙටිපණිවුඩය හෝ ඉ-තැපැල හරහා පාසල් එන්නත් වැඩසටහනට අදාළ තොරතුරු ලබා දිය හැක. ඔබට ඔබේ දරුවා පාසල් යන ප්‍රදේශයේ පාලන සභාව සම්බන්ධ කර ගැනීමෙන් ඔබේ දරුවාගේ දත්ත වෙත ප්‍රවේශ විය හැක.

## ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන යනු කුමක්ද?

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන් කාලසටහන ළමයින්, පාසල් වැඩසටහන්, වැඩිහිටියන්, ඇබොරිජිනල් සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වාසීන් සහ අවදානමේ සිටින අනෙකුත් පුද්ගලයින් සඳහා නොමිලේ එන්නත්කරණ සකසයි. වැඩසටහනේ කොටසක් වශයෙන්, නොමිලේ එන්නත් වයස අවුරු 15 සිට 16 දක්වා ඇති හෝ ද්විතීයික පාසලේ 10 වසරේ සිටින නව යෞවනයන් සඳහා නිදෙර්ශිතයි. නොමිලේ ලබා ගැනීමේ එන්නත්කරණය වයස අවුරුදු 20 දක්වා අයට ලැබේ.

# Office use only

| **Vaccine** | Meningococcal ACWY | | | | |
|---|---|---|---|---|---|
| **Vaccination date** | | **Nurse initials** | | **Site: L/R arm** | |

අනුමත කර ප්‍රකාශන කළේ Victorian Government, 1 Treasury Place, Melbourne. © වික්ටෝරියා ප්‍රාන්තය, සෞඛ්‍ය දෙපාතර්මේන්තුව, 2021 නොවැම්බර්. (2010813)

# Meningococcal ACWY Secondary School Vaccine Program consent card

Complete, sign and return to school

## How to complete the form

- Please read the Meningococcal ACWY information and the information in the vaccine consent form.
- Complete the Vaccine consent section and sign or type your name if a Yes.
- Return the consent form to the school even if you do not want your child to be vaccinated.

# Meningococcal ACWY information

## Meningococcal ACWY

Meningococcal disease is caused by bacteria. Although meningococcal disease is uncommon, it can become very serious, very quickly. About 10 per cent of people carry meningococcal bacteria in their throat without becoming unwell. These people are known as ‘carriers’. Meningococcal bacteria are passed from person to person by regular, close, prolonged household and intimate contact. Adolescents are at increased risk of meningococcal disease and more likely to spread the disease to others.

Invasive meningococcal disease occurs when these bacteria enter the blood stream to cause septicaemia (infection in the blood, also known as ‘bacteraemia’) or meningitis, (inflammation of the membrane covering of the brain). Death can occur in up to 10 per cent of cases. Occasionally, severe infection can also occur in the joints, throat, lungs or intestines.

There are different strains (serogroups) of meningococcal bacteria known by letters of the alphabet, including meningococcal A, B, C, W and Y. In recent years some of these meningococcal strains have increased across Australia.

Meningococcal B vaccination is strongly recommended for adolescents aged 15 to 19 years. Meningococcal B vaccination is available on prescription and this can be discussed with your doctor.

## Meningococcal ACWY vaccine

The Meningococcal ACWY vaccine, Nimenrix®, is a four-in-one combined vaccine for protection against meningococcal A, C, W, Y strains. Studies have shown that this vaccine can provide up to 97 per cent immunity in adolescents. Meningococcal ACWY vaccination programs have been implemented in adolescents in the UK since 2015 and recommended in the US since 2005.

The vaccine does not contain any live bacteria and cannot cause meningococcal disease. The meningococcal ACWY vaccine will boost adolescents with the C strain they had as a baby and protect against the A, W and Y strains.

## How is the vaccine given?

The Meningococcal ACWY vaccination is a single injection administered into the upper arm.

## Possible side effects of meningococcal ACWY vaccine

Most side effects are minor and quickly disappear. If the following reactions occur, it will be soon after vaccination.

### Common side effects

- Mild temperature
- Headache
- Dizziness
- Loss of appetite
- Pain, redness and swelling at the injection site
- Fainting may occur up to 30 minutes after any vaccination.

If mild reactions do occur, the side effects can be reduced by:

- Drinking extra fluids and not over-dressing if the person has a fever
- Taking paracetamol and placing a cold, wet cloth on the sore injection site.

### Extremely rare side effects

- Severe allergic reaction.

In the event of a severe allergic reaction, immediate medical attention will be provided. If reactions are severe or persistent, or if you are worried, contact your doctor or hospital.

## Pre-immunisation checklist

Before you or your child is immunised, tell your doctor or nurse if any of the following apply.

- Is unwell on the day of immunisation (temperature over 38.5°C)
- Has any severe allergies
- Has had a severe reaction to any vaccine
- Is pregnant.

After vaccination wait at the place of vaccination a minimum of 15 minutes.

# Further information

If you require further advice or information, please contact your local council immunisation service or local doctor.

Better Health Channel <https//www.betterhealth.vic.gov.au>

Australian Government Department of Health <https:www.health.gov.ai/health-topics/immunisation>

Translating and interpreting service call 131 450

# Meningococcal ACWY vaccine consent form

## Student details (as recorded on the Medicare card)

| | |
|---|---|
| **Medicare number (including number beside child's name)**<br>**(Non-Medicare cardholders are also eligible for this vaccine)** | |
| **Surname** | |
| **First name** | |
| **Postal address** | |
| **Postcode** | |
| **Date of birth** | |
| **Gender** | <please indicate gender> |
| **School name** | |
| **Class** | |

Is this person of Aboriginal or Torres Strait Islander origin? Mark chosen response with an 'X'

| | |
|---|---|
| **No** | |
| **Aboriginal** | |
| **Torres Strait Islander** | |
| **Aboriginal and Torres Strait Islander** | |

## Parent/guardian contact details

| | |
|---|---|
| **Name of parent/guardian** | |
| **Daytime phone** | |
| **Mobile** | |
| **Email** | |

## Vaccine consent

Declaration: I am authorised to give consent or non-consent for my child to be vaccinated. I have read and I understand the information given to me about vaccination, including the risks of not being vaccinated and the side effects of the vaccine. I understand I can discuss the risks and benefits of vaccination with my local council or doctor. I understand that consent can be withdrawn at any time before vaccination takes place.

Please mark your chosen response, below, with an 'X'.

| | |
|---|---|
| **YES, I CONSENT to my child receiving the Meningococcal ACWY vaccine at school**.<br>The Meningococcal ACWY vaccine is a four-in-one combined vaccine for protection against meningococcal A, C, W, Y strains (one injection). | |
| If you have selected 'Yes' above, please sign or type your name. | |
| Date you signed this form. | |
| **No, I do not consent to my child receiving the Meningococcal ACWY vaccine at this time**. | |
| **No, my child has had the Meningococcal ACWY vaccine elsewhere.** | |



**OFFICIAL**

| |
|---|
| Please insert here any pre-existing medical condition, severe allergies or previous severe reaction to vaccination. |

## Privacy statement

The meningococcal ACWY vaccine program is a Commonwealth government funded vaccine program. Vaccines are administered by an immunisation nurse, employed by local council immunisation services, who visit each Victorian secondary school a number of times a year. Under the *Public Health and Wellbeing Act 2008*, local councils are responsible for coordinating and providing immunisation services to children being educated within the municipal district. Local councils are committed to protecting the privacy, confidentiality and security of personal information, in accordance with the *Privacy and Data Protection Act 2014* and the *Health Records Act 2001*.

Local councils report all adolescent vaccines given through school programs to the Australian Immunisation Register (AIR). Personal identifying details will be kept confidential. This will provide tools such as recall and reminder systems to improve adolescent vaccination rates. This is important to improve immunisation rates overall. Individuals will have access to their record of all vaccines recorded in the Australian Immunisation Register. Aggregate immunisation data may be disclosed to the Victorian government for the purpose of monitoring, funding and improving the Meningococcal ACWY Secondary School Vaccine Program. This information does not identify any individual.

Information related to you or your child will be used or disclosed for purposes directly related to your child's immunisation, and in ways that you would reasonably expect. This may include the transfer or exchange of relevant information to your GP, to your child's GP, to another treating health service or hospital or another local council. The local council may provide you with information related to the school vaccine program via SMS or email. You can access your child's data by contacting the local council where your child attends school.

## What is the National Immunisation Program?

The National Immunisation Program schedule sets out free vaccinations for children, school programs, adults, Aboriginal and Torres Strait Islander peoples and other people at risk. As part of the program, free vaccines are recommended for adolescents aged 15 to 16 years or in Year 10 of secondary school. Free catch-up vaccination is available up to 20 years of age.

## Office use only

| **Vaccine** | Meningococcal ACWY | | | | |
|---|---|---|---|---|---|
| **Vaccination date** | | **Nurse initials** | | **Site: L/R arm** | |

Authorised and published by the Victorian Government, 1 Treasury Place, Melbourne. © State of Victoria, Department of Health November 2021. (2010813)